# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No } 2171635 10120

ෆැක්ස්
தொலைநகல
Fax } 011-

දුරකථන
தொலைபேசி
Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site } www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } dir.media@police.gov.lk

මගේ අංකය
எனது இலக்கம்
My NO } 1498 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No } / 2024

දිනය
திக
Date } 22/09/2024 පැය 0540

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - කෑගල්ල පොලිස් වසම

2024.09.21 වන දින රාත්‍රී කාලයේ කෑගල්ල පොලිස් වසමේ මොලගොඩ ප්‍රදේශයේදී පුද්ගලික ආරවුලක් මත පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී ඇති බවට කෑගල්ල පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත. තුවාලකරු කෑගල්ල රෝහල වෙත ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 37 ක් වූ පල්පාත, මොලගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු අසල්වැසි නිවසකට ගොස් නැවත නිවසට පැමිණෙමින් සිටියදී මෙම ඝාතනය සිදුව ඇති බවට අනාවරණය වී නොමැත. සැකකරු පලා ගොස් ඇති අතර, අපරාධයට සම්බන්ධ සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා කෑගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - මිරිහාන පොලිස් ස්ථානය.

2024.09.21 වන දින උදෑසන කාලයේ මිරිහාන පොලිස් වසමේ සන්තානම්පිටිය ප්‍රදේශයේදී නිවසක සිටි වයස අවුරුදු 35 ක් පැඟිරිවත්ත, සන්තානම්පිටිය ප්‍රදේශයේ පදිංචි කාන්තාවකට මන්නා පිහියකින් පහරදී ඝාතනය කිරීම සම්බන්ධව මිරිහාන පොලිස් ස්ථානය විමර්ශන ආරම්භ කරන ලදී.

මෙම ඝාතනය එම නිවසේ පෙර රියදුරු ලෙස සේවයේ කළ පුද්ගලයා විසින් සිදුකර ඇති බවට අනාවරණය වී ඇති අතර මොහු ඇල්පිටිය පොලිස් වසමේ බෙන්තර ගඟට පැන සිය දිවි හානි කර ගැනීමට තැත් කිරීමේදී අත්අඩංගුවට ගෙන මිරිහාන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු  වයස අවුරුදු 45 ක් වූ පුහුල්වැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මිරිහාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. සැකකටයුතු මරණයක් - පුස්සැල්ලාව පොලිස් වසම.

2024.09.21 වන දින දහවල් කාලයේ පුස්සැල්ලාව පොලිස් වසමේ සෙන්කුවාර් ඇලේ සෙන්කුවාර් වත්ත ප්‍රදේශයේ පුද්ගලයෙකුගේ මෘත ශරීරයක් ඇති බවට පුස්සැල්ලාව පොලිස් ස්ථානය වෙත ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක් වූ සෙන්කුවාර් වත්ත, පාරදෙක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් කිහිප දෙනෙකු සමඟ උදෑසන නිවසෙන් පිටව ගොස් ඇති අතර, මෘත ශරීරයේ මුඛයෙන් සහ නහයෙන් ලේ වහනය වී ඇති බවට නිරීක්ෂණය වී ඇත.

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු මහනුවර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පුස්සැල්ලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. ශරීරයට ගිනි ඇවිළී කාන්තාවක් මියයාමක් - යාපනය පොලිස් වසම.

2024.09.21 වන දින රාත්‍රී කාලයේ යාපනය පොලිස් වසමේ චුන්ඩුකුලී ප්‍රදේශයේ ශරීරයට ගිනි ඇවිළී කාන්තාවක් මියගොස් ඇති බවට යාපනය පොලිස් ස්ථානය වෙත ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 72 ක් වූ චුන්ඩුකුලී, යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකාරිය තනිව නිවසේ ජීවත්ව සිට ඇති අතර, දින කිහිපයක සිට නිවස වසා දමා ඇති බැවින් පොලිස් ස්ථානයට පැමිණිලි කර ඇත. පසුව නිලධාරීන් විසින් සොයා බැලීමේදී දින කිහිපයකට පෙර පෙර පිළිස්සී ගිය මෘත ශරීරය හමුවී ඇත.

මෘත ශරීරය පොලිස් ආරක්ෂාව යටතේ සිද්ධිය වූ ස්ථානයේ ඇත. යාපනය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - ඇල්පිටිය පොලිස් වසම.

2024.09.21 වන දින සවස් කාලයේ ඇල්පිටිය පොලිස් වසමේ කැටපල ඕමත්ත මාර්ගයේ කජුගස්වත්ත ප්‍රදේශයේදී කැටපල දෙස සිට නාගහතැන්න දෙසට ධාවනය වූ ත්‍රිරෝද රථයක් රියදුරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයේ පෙරළී ගොස් මාර්ගයේ නවතා ගෙන සිටි යතුරු පැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ත්‍රී රෝද රථයේ රියදුරු, යතුරු පැදිකරු, යතුරු පැදියේ සිටි කාන්තාවක්, වයස අවුරුදු 13 ක දැරියක් සහ අවුරුදු 04 දරුවෙකු තුවාල ලබා ඇල්පිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු ත්‍රිරෝද රථ රියදුරු මියගොස් ඇත.

**මරණකරු  වයස අවුරුදු 53 ක් වූ හේන පාර, ඇල්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඇල්පිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඇල්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - පූනෑව පොලිස් වසම.

2024.09.21 වන දින සවස් කාලයේ පූනෑව පොලිස් වසමේ පූනෑව මහකුඹුගොල්ලෑව මාර්ගයේ වාරක්කෑව පාර ප්‍රදේශයේදී පූනෑව දෙස සිට මහකුඹුගොල්ලෑව දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන පාලමේ ආරක්ෂක වැටේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරු පැදිකරු සහ පසු පැදිකරු තුවාල ලබා මැදවච්චිය රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 50 ක් වූ මහකුඹුගොල්ලෑව, පූනෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පූනෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - නාගොඩ පොලිස් වසම.

2024.09.21 වන දින රාත්‍රී කාලයේ නාගොඩ පොලිස් වසමේ මාපලගම මලාමුර මාර්ගයේ කොළඹ කඩේ හන්දිය අසලදී මාපලගම දෙස සිට මලාමුර දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාර්ගය අයිනේ ගමන් කරමින් සිටි පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරු පැදිකරු සහ පදිකයා තුවාල ලබා නාගොඩ රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කරාපිටිය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී පදිකයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 64 ක් වූ පරණ තානායම් ගොඩ, මාපලගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. නාගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**